**මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 - 2022**

**---------------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා දහතුනෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 13 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 ක ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු ඉඩම්, ගොඩනැගිලි, දේපළ සහ යන්ත්‍රෝපකරණවල වටිනාකම තක්සේරුකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | අයිතිය පවරා ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02 ක රු. 180,000 ක් වටිනා වගකීම් දෙකක් ගිණුම්වල දක්වා නොතිබුණි. | මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ගැලපීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් කපා හැරිය යුතු සහ පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම්වල එකතු වටිනාකම රු. 7,923,384 ක් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වැරදීමකින් කපා හැරීමට නොහැකිවූ අතර, ගැලපීම් කරන ලෙස දැනුවත් කර ඇත. | ගැලපීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඈ) | පාලම්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ යූරියා පොහොර විකිනීමෙන් ලද මුදල වන රු.19,681,498 ක් සහකාර කොමසාරිස් වෙත යවා එම මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ | ගිණුම් පොත්වල නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගැලපීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදමක් වශයෙන් දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් ඉක්මවූ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | මුරුංගන් ගොවිජන සේවා කාරක සභාවේ ඉකුත් වර්ෂවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිමිකම් යටතේ දක්වා තිබූ වෙන්කිරීම් රු.190,167 ක් සමාලෝචිත වර්ෂයේ කිසිම සටහනක් නොකර මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර තිබූ නිසා හිමිකම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට දැනුවත් කර ඇත. | ගැලපීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**1.3.2 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානවල ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.7,904,598 ක් පෙන්වා තිබුණද, එය සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ලැබිය යුතු ඇතැම් උපලේඛන ලබා ගත නොහැකිව ඇති අතර, කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| | (i) 44(1) වගන්තිය | එක් එක් ගොවි සංවිධානවල ගිණුම් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයකු විසින් පරීක්ෂා කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 13 ක ගිණුම් පරීක්ෂාවට ලක් කර නොතිබුණි. | ගිණුම් ඉදිරි වර්ෂවලදී නිසි පරිදි පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 45(1) වගන්තිය | කුඹුරු ඉඩම් නාම ලේඛනය ගොවිජන සේවා කොමසාරිස් සහතික කළ යුතු | 45(1) වගන්තිය අනුව අවශ්‍ය කටයුතු | ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවත්, ගොවිජන සේවා කාරක සභා 13 ක කුඹුරු ඉඩම් නාම ලේඛනය ගොවිජන සේවා කොමසාරිස් විසින් සහතික කර නොතිබුණි. | කරනු ලැබේ. | කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති 01/2020 අංක දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 9.1 ඡේදය | මුදල්, චෙක්පත් සහ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් ගෙන් ඇප මුදල් ලබා ගැනීමට ඉකුත් වර්ෂ 03 ක සිට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ විස්තර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. | නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13 ක මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,918,767 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.104,952 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,813,815 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යමක්ෂතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජපන් යෙන් අධාර වැඩසටහන් යටතේ ගොවීන් 4 දෙනෙකු වෙත වාරික වශයෙන් ගෙවීමට ලබා දී තිබු අත් ට්‍රක්ටර් ණය මුදලේ හිඟය වන රු. 845,000 ක් වර්ෂ අටකට වැඩි කාලයක් හිඟව තිබුණද, ඉලුප්පෙයිකඩවෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් අයකර කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත. | අදාල හිඟ මුදල සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යමක්ෂතා

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක දීර්ඝ කාලයක සිට අයවිය යුතුව තිබු එකතුව රු.4,900,378 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල්වලට අදාල විස්තර නොතිබුණි. | හිඟ මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක දීර්ඝ කාලය සිට ණය හිමියන්ට ගෙවිය යුතු එකතුව රු. 5,119,580 ක මුදල ගෙවා නිමකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල්වලට අදාල විස්තර නොතිබුණි. | අදාල ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාන්තයි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වර්ග තුනකට අයත් අයිතම් 15 ක වත්කම් වර්ෂ අටකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණද, එය ඉවත් කිරීමට හෝ නැවත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීමට සහ ඉවත් කිරීමට කටයුතු කර ඇත. | අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ට්‍රැක්ටර් රථ 36 ක් සහ වර්ග 11 ක වත්කම් 88 ක් වර්ෂ අටකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණද, එය ඉවත් කිරීමට හෝ නැවත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් කපා හැරීම සඳහා කමිටුවක් පත්කර අවශ්‍ය කටයුතු කරමින් පවති. | අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 13 ක 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යා සහ තත්‍ය සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර, විධිමත් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බව විගණනයේදි නිරීක්ෂණ විය. | මෙම වර්ෂයේ ගිණුම් වාර්තාව සමඟ අනුමත සේවක සංඛ්‍යා සහ තත්‍ය සේවක සංඛ්‍යා විගණනයට ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇත. | අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.5 වාහන කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන සතු සියළු ට්‍රැක්ටර් රථවල අයිතිය පවරා ගැනීමට සහ වාහනවල ලොග් පොත් සහ දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් සියළුම ට්‍රක්ටර් රථවල අයිතිය පවරා ගැනීමට සහ ලොග් පොත් හා ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | අයිතිය පවරා ගැනීමට, ලොග් පොත් සහ ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනැති 02/2020 අංක දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරියේදි පිළියෙල කිරිමට කටයුතු කර ඇත. | අදාල චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි අනුව පිළියෙල කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තොම්බර් 16 වන දිනැති අංක 107 දරණ චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව 01 සිට 16 දක්වා වන ආදායම් නිසිපරිදි හඳුනාගෙන ඇස්තමේන්තු කර සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි චක්‍රලේඛය අනුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කරන මෙන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ අංක 19 දරණ තිරසර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන අරමුණු (2030 වර්ෂයේ) ලඟා කර ගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකළ යුතු ඉලක්ක සහ එම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සහ එහි ප්‍රගතිය මැනීමට අවශ්‍ය දර්ශක වර්ෂ 05 ක කාලයක සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණ ලඟා කර ගැනීමට වර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු ඉලක්ක, සහ එම ඉලක්කයන් ලඟා කර ගැනීම එහි ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය කටයුතු කළ යුතුය. |